# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 74 — 1973 අගෝස්තු 24 වැනි සිකුරාදා — 1973.08.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 863 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | 864 |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 867 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... | 870 |
| මිළ පාලන දැන්වීම් ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 878 |
| '' සුරාබදු ආඥාපනත '' පිළිබඳ දැන්වීම් ... | — |


සැළකිය යුතුයි.—විනිමය පාලන (සංශෝධන) පනතේ කෙටුම් පත 1973 අගෝස්තු 17 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය

### 1973 අංක 397 ...

අංකය : ඩී. 21/ආර්ර්සීටී/714

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරයෙන් ඉල්ලා අස්වීමක්**

1973 සැප්තැම්බර් මස 01 දින සිට, යුද්ධ හමුදාවේ ස්ථිර බලහමුදාවෙන් පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරයෙන් ඉල්ලා අස්වීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන ඇත :—

මේජර් ඒබ්‍රහම් ලෙස්ලි සිරිපාල රණසිංහ මුතුකුඩ., ලයුවෙබ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. ඩී. ඩී. පීරිස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ලේකම්.

1973 අගෝස්තු මස 3 වැනි දින,
කොළඹ දීය.

8-908 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 398

අංකය : ඩී/වීඑෆ්/9/ඒ.

**යුද්ධ හමුදාව—ශ්‍රී ලංකා සෙවේච්ඡා බල සේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා ස්වේච්ඡා බල සේනාවේ පොදු උප සේවයට මාරු කිරීමක්**

1973 ජූලි මස 01 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියාව ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ පොදු උප සේවයට මාරු කරන ලදී :—

ලුතිනන් කර්නල් ජිනදාස ජෙරාල්ඩ් සමරකෝන්., ඊඩී ලයුසේබ

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇම්. ඩී. ඩී. පීරිස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ලේකම්.

1973 අගෝස්තු 4 දින,
කොළඹ දී ය.

8-1063 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවට පසුව මෙහි ලැබෙන සියලුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

එම්. ඒ. සී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩී. කෘෂ්. හලගහකෝන් මහතා 1973 ජූලි මස 13 වැනි සහ 16 වැනි දිනයන්හි මීගමුව දිස්ත්‍රික්කයේ අළුත්කුරුකෝර ලේ උතුර ඒ සහ බී අළුත්කුරු කෝරලේ දකුණ සහ සියනෑ කෝරලේ බස්නාහිර (අධිකාරිපත්තු) ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

පී. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, අයි. එම්. වීරත්න මෙනවිය 1973 ජූලි මස 11 සිට 13 දක්වා, 24 සිට 28 දක්වා, 30 සිට 31 දක්වා සහ 1973 අගෝස්තු මස 1 සිට 4 දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ අට කලන් හා කොලොන්න කෝරලේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ඉසෙඩ්. ඒ. ඇම්. තාසිම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1973 අගෝස්තු මස 25 දින සිට දින පහලොහක (15) කාලසීමාවකට උතුරු කොළඹ කාති උසාවියේ අංක. 4699/එම් දරණ නඩුව ඇසීමට හා අසා නිමකර තීන්දු දීමට උතුරු කොළඹ අතිරේක කාති වශයෙන් වැඩ බැලීමට.

එම්. අයි. එච්. එම්. සලී මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1973 සැප්තැම්බර් මස 3 වැනි දින සිට දින පහලොවක (15) කාලසීමාවකට දකුණු කොළඹ කාති උසාවියේ අංක 1993/එම් සහ 1994/සීඑම දරණ නඩු ඇසීමට හා අසා නිමකර තීන්දු දීමට දකුණු කොළඹ අතිරේක කාති වශයෙන් වැඩ බැලීමට.

එස්. පී. මරික්කාර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1973 අගෝස්තු මස 4 දින සිට දින පහලොවක (15) කාලසීමාවකට ගම්පහ කාති උසාවියේ අංක 435 දරණ නඩුව ඇසීමට හා අසා නිමකර තීන්දුව දීමට ගම්පහ අධිකරණ කොට්ඨාශයේ අතිරේක කාති වශයෙන් වැඩ බැලීමට.

ටී. පී. පස්සල මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1973 අගෝස්තු මස 01 වැනි දින සිට දින පහලොවක (15) කාල සීමාවකට බදුල්ලේ පරිපාලන දිස්ත්‍රික්කයේ කාති වශයෙන් වැඩ බැලීමට.

එස්. පී. මරික්කාර් මහතා අළුත් පත්වීමක් කරනතුරු තුන් මසකට වැඩි නොවන කාලයක් සඳහා 1973 අගෝස්තු මස 1 වැනි දින සිට මීගමුවේ අධිකරණ කොට්ඨාශයේ කාති වශයෙන් වැඩ බැලීමට.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ
ලේකම්.

අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ. පෙ. අංක 573,
1973 අගෝස්තු මස 16 වැනි දින,
සී. 52, කැප්පෙටිපොල පාර,
කොළඹ 5 දීය.

8-1112/1 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 401

**අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් කරන ලද ස්ථානමාරු පත්කිරීම් පහත සඳහන් වේ**

කේ. ඇස්. ගුණතිලක මහතා 1973 අගෝස්තු මස 01 වැනි දින සිට නැවත නියෝගයක් කරන තෙක් බදුල්ලේ සිට කුලියාපිටියට ස්ථාන මාරු නියෝගකර කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල, බිංගිරිය සහ දේවමැදි හත්පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන්.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ
ලේකම්.

අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ. පෙ. අංක 573,
1973 අගෝස්තු මස 16 වැනි දින,
සී. 52, කැප්පෙටිපොල පාර,
කොළඹ 5 දී ය.

8-1112/2 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

# වෙනත් පත් කිරීම් ආදිය

1973 අංක 402

පා 4/2/15 — පා 4/1/2/2/73 (වා)
පා 4/2/12 — පා 4/1/26/87/73 (වා)
පා 4/1/15/73 — පා 4/1/37/139/73 (වා)

**අධිකරණ ආඥාපනත**

(6 වන අධිකාරිය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 සහ 83 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම,

1. පියදාස තෙන්නකෝන් මහතා නවදුන් කෝරළයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

2. අයි. ඩී. ටී. ගුණතිලක මහතා උඩසිය ගම්සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

3. ජයසේකර මුදියන්සෙලාගේ සියාතු මහතා උ. හේ. ගඟ පළාත කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ නුවරඑළිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

4. අයි. ඒ. ඩී. පී. ගුණතිලක මහතා වරකාගොඩ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

5. දොන් ජෝර්ජ් කුලසේකර මහතා වගුර ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

6. එන්. දයානන්ද ධර්මසේන මහතා පානදුර, තොටමුන ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

7. ඩී. ඩී. කොතලාවල මහතා මාම්පේ, කැස්බෑව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

8. කේ. වී. ඩී. විජේසේන මහතා කළුතර තොටමුණ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

9. ටී. ඩී. ජේ. අවුසදරත්න මහතා මූංවත්තෙ බාගෙපත්තුව ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

10. ඩී. ඩී. රණවීර මහතා කළුතර ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

11. වත්නිආරච්චිගේ ධර්මදාස ෆොන්සේකා මහතා හොරණ නගර සභා සීමාව තුළ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

12. ඒ. ඇම්. ප්‍රනාන්දු මහතා උතුරු අළුත්කුරු කෝරළේ තලාහේන පේරුව හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

13. දිනපාල ද සිල්වා මහතා කොළඹ දිස්ත්‍රික්කයේ ජාඇල දඹුගම් පේරුව හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

14. ඇල්. ඒ. ගනේපොල මහතා උතුරු අළුත්කුරු කෝරළේ දාසිය පත්තුව ‘බී’ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

15. ඩේවිඩ් සෙනෙවිරත්න මහතා ගම්පහ, සියනෑකෝරළේ අධිකාරී පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චය කාර වරයෙකු වශයෙන් ද,

16. මොරගොඩ විතානගේ ජයසිරි ආරියසිංහ මහතා හාපිටිගම කෝරළේ උඩුගහ පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

17. එම්. ඩී. සී. විජේසූරිය මහතා ගම්පහ නගර සභා සීමාව සහ අතිරේක මරණ පරීක්ෂක මැදපත්තුව, සියනෑ කෝරළේ බටහිර හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

18. මදුරප්පෙරුමගේ වෝල්ටර් පෙරේරා, මහතා නැගෙනහිර සියනෑ කෝරළේ ගඟබඩ පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

19. ජේ. එම්. එස්. ජයසේකර මහතා කොළඹ දිස්ත්‍රික්කයේ අධිකාරි පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා, සමාදාන විනිශ්චය කාර වරයෙකු වශයෙන් ද,

20. එම්. ඒ. ඩී. එම්. සමරසිංහ මහතා නැගෙනහිර සියනෑ කෝරළේ ගඟබඩ පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

21. කේ. ටී. ඒ. ධර්මසේන මහතා හාපිටිගම කෝරළේ, යටිගහ දකුණ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

22. කේ. ඒ. ඩී. ප්‍රැන්සිස් කීනවින්න මහතා බටහිර සියනෑ කෝරළේ මැද පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

23. රන්දුනු පතිරන්නැහෙලාගේ දොන් යසවර්ධන මහතා දකුණු අලුත්කුරු කෝරළේ සහ බටහිර සියනෑකෝරළේ අධිකාරි පත්තුවේ ග්‍රා. සේ. අංක 251, 253, 255, 267, 277 සහ 278 හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

24. එච්. පේද්‍රික් අප්පුහාමි මහතා දූනගහ පත්තු අළුත්කුරු කෝරළේ නෝත් බී හා උතුරු අළුත්කුරු කෝරළේ බී දාසිය පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

25. ඩබ්. ඒ. පොන්සේකා මහතා දෙහිවල ගල්කිස්ස ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

26. දොන් ස්ටීවන් සෙනෙවිරත්න මහතා අඹතලෙන් පහළ සහ කෝට්ටේ පේරුව හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චය කාර වරයෙකු වශයෙන් ද,

27. ගුණපාල දිසානායක මහතා සමස්ත ලංකා තැපැල් හා විදුලි පණිවුඩ සේවක සංගමයේ මධ්‍යම කාරක සභික සහ එකී සංගමයේ මහනුවර ප්‍රාදේශීය ලේකම් ධුරය දරණ කාලය තුළ මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

28. වේලින් ගුණසිංහ මහතා සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතියේ උප ලේකම් ධුරය දරන කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

29. ජී. පී. ඩී. අමරසිංහ මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චය කරුවෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

30. අරුණාසලම් ගනේසාල් මෙනවිය කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරියකු වශයෙන් ද,

31. රම්පටබැඳිගේ විලියම් වීරවංශ මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

32. සම්සුදීන් හයාතු මොහොමඩ් මහතා ත්‍රිකුණාමලය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

33. ඩබ්ලිව්. සිරිසේන මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

පත් කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 අගෝස්තු මස 10 වන දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-959 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## 1973 අංක 403

(20 වැනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වැනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : පා4/හමප22/17

(1) පියදාස තෙන්නකෝන් මහතා 1973. 07. 06 වැනි දින සිට රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළය සඳහා අතිරේක හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ද,

අංකය : පා4/හමප/6/6

(2) ජයසේකර මුදියන්සේලාගේ පියාතු මහතා 1973. 07. 11 වැනි දින සිට නුවරඑළිය දිස්ත්‍රික්කයේ උ. හේ. ගඟ පළාත කෝරළයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් ද,

පත් කරනු ලැබ ඇත්තේ ය.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ ලේකම්.

1973 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-960 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## අවලංගු කිරීම

(20 වැනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වැනි වගන්තිය යටතේ අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : පා4/හමප 16/14.

1. ඩබ්. එම්. විජේරත්න මහතා වැලිඩවිල්ලි හත්පත්තුවේ ගන් දහය කෝරළය සඳහා හදිසි මරණ පරීක්ෂකවරයෙකු වශයෙන් කර ඇති පත්වීම, වහාම ක්‍රියාත්මක වන සේ අවලංගු කර ඇත්තේ ය.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ ලේකම්.

1973 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-963—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## 1973 අංක 404

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

නුගේගොඩ උඩහමුල්ලේ අංක 436 පදිංචි පියදාස බියන්විල මහතා පරණ කොට්ටාව පාරේ වාසස්ථානය සහ කාර්යාලය ද ගංගොඩවිල හයිලෙවල් පාරේ අතුරු කාර්යාලය ද ඇතුව කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 දින,
කොළඹ දී ය.

8-1021—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

1973 අංක 405

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

කොටහේනේ ශාන්ත ලුසියා වීදියේ අංක 24 පදිංචි මාරියම් පිල්ලෙයි පිලෝමින් මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 දින,
කොළඹ දී ය.

8-1020 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

1973 අංක 406

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

රුවන්වැල්ලේ කහටගස්තැන්නේ පදිංචි ස්වර්ණා පද්මිණී ජයසිංහ මෙනෙවිය රුවන්වැල්ලේ වාසස්ථානය සහ කාර්යාලයද යටියන්තොට අතුරු කාර්යාලය ද ඇතුව අවිස්සාවේල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 දින,
කොළඹ දී ය.

8-1025 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

1973 අංක 407

**නොතාරිස් ආඥපණත (107 වන අධිකාරය)**

හන්වැල්ලේ කළුඅග්ගල පදිංචි ජාලිස් ගනේ ආරච්චි පතිරණ මහතා කළුඅග්ගල වාසස්ථානය සහ කාර්යාලය ද ඇතුව අවිස්සාවේල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 වන දින,
කොළඹ දීය.

8-1019 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

1973 අංක 408

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

මහනුවර පේරාදෙණිය පාරේ අංක 68 " යමුණා " හි පදිංචි මැලරින් දන්තනාරායන මහත්මිය මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 දින,
කොළඹ දී ය.

8-1023 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

1973 අංක 409

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

ගෙලිඔය පදිංචි කරුණාතිලක රාජපක්ෂ වාසල මුදියන්සෙලාගේ කළුබණ්ඩා කරුණාතිලක මහතා ගෙලිඔය වාසස්ථානය සහ කාර්යාලය ද දවුලගල අතුරු කාර්යාලය ද ඇතුව මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 වන දින,
කොළඹ දීය.

8-1017 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

1973 අංක 410

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

චාවකච්චේරියේ දකුණු මච්චුවිල් " ඊශ්වරි ලොජ්යි " පදිංචි වෙල්ලප්පා අම්බිකයිපාළන් මහතා යාපනය අධිකරණ කොට්ඨාශය අතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 වන දින,
කොළඹ දීය.

8-1018 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

1973 අංක 411

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

මාවතගම උඩදෙණියේ " කුමාර සෙවන " හි පදිංචි වික්‍රමගේ පීටර් හපුවන්ත මහතා කුරුණෑගල නගරයේ ප්‍රධාන කාර්යාලය ද මාවතගම අතුරු කාර්යාලය ද ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 දින,
කොළඹ දී ය.

8-1022 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

1973 අංක 412

**නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)**

අනුරාධපුරයේ පදිංචි ශාන්තකුමාරි පරම් සිංහරාජා මහත්මිය අනුරාධපුරය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 දින,
කොළඹ දී ය.

8-1026 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 413

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

රක්වානේ කජුගස්වත්තේ පදිංචි නිමන්ත ජයසූරිය මහතා පැල්මඩුල්ලේ වාසස්ථානය සහ කාර්යාලය ද රක්වානේ අතුරු කාර්යාලය ද ඇතුව රත්නපුර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 වන දින,
කොළඹ දීය.

8-910—73.08.24 දින අංක 74 දරන ගැසට් පත්‍රය

### 1973 අංක 414

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

ගෝවාදිවෙල පිටවෙල "ශාන්ති" නිවසේ පදිංචි ප්‍රෙඩ්රික් ජෝර්ජ් විජයසිරි ගොඩකුඹුර මහතා මාවනැල්ල ප්‍රධාන කාර්යාලයද උදුගොඩ අතුරු කාර්යාලය ද ඇතුව කෑගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 වන දින,
කොළඹ දී ය.

8-1024—73.08.24 දින අංක 74 දරන ගැසට් පත්‍රය

# ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 20/51

**ගුවන් ගමනාගමන පනත**

(365 වන අධිකාරය වූ) ගුවන් ගමනාගමන පනතේ 24 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහණ අමාත්‍යවරයා.

1973 අගෝස්තු මස 6 දින,
කොළඹ 1.

නියෝග

1955 ජූලි මස 1 වන දින අංක 10812 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගවල 183 වන නියෝගයේ (3) වන ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) (අ) ජලයට ඉහලින් නැව් සැතැප්ම එක් දහසකට වැඩි මහා වෘත දුර ප්‍රමාණයක පියාසර කිරීමට සිදුවිය හැකි ගුවන් ගමනක, හෝ

(ආ) බිමට නොබස්වා නැව් සැතැප්ම 1,500 ට වැඩි මහා වෘත දුර ප්‍රමාණයක පියාසර කරන ගුවන් ගමනක

යෙදෙන සෑම පොදු ප්‍රවාහන ගුවන් යානයකම ගුවන් යාත්‍රිකයකුගේ තත්ත්වයෙන් ක්‍රියා කිරීම සඳහා ගුවන් යාත්‍රික බලපත්‍රයක් දරන්නා වූ තැනැත්තකු සිටිය යුතුය. ඔහු යාත්‍රාව ක්‍රියා කරවීමේ නියමු පිරිසේ අනිකුත් සාමාජිකයන්ගේ බාහිර තැනැත්තකු විය යුතු අතර යාත්‍රික කටයුතු හැර ගුවන් යානයේ වෙනත් කටයුතු නොකළ යුතුය:

එසේ වුව ද නියමුවකු සහ දෙවන නියමුවකු ගෙන යන අවස්ථාවලදී ඒ දෙදෙනාගෙන් ගුවන් යාත්‍රිකයකු වශයෙන් බලපත්‍රයක් දරණ තැනැත්තා උපකරණ ප්‍රමාණමයක් ඇති වර්ගයේ ගුවන් යානයක් පිළිබඳ වාණිජ, ජ්‍යෙෂ්ඨ වානිජ හෝ ගුවන් සමාගම් ප්‍රවාහණ නියමු බලපත්‍රයක් දරන්නේ නම් ඒ තැනැත්තාට ගුවන් යානය යාත්‍රා කරවීමේ වගකීම දැරිය හැකිය.

එසේම තවදුරටත් දෘෂ්ටි හෝ අදෘෂ්ටි භූමි ආධාර පාවිච්චි කිරීමෙන් එවැනි ගුවන් ගමන් කරවීම ඉටුකර ගත හැකි නම් ගුවන් යාත්‍රික බලපත්‍රයක් දරන තැනැත්තකු ගුවන් ගමන් නියමු පිරිසේ සාමාජිකයකු ලෙස ගුවන් යානයේ සිටීමේ අවශ්‍යතාවය අධ්‍යක්ෂ විසින් අත්හැරිය හැකිය."

8-955—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී. 277/40

**පුරාවස්තු ආඥාපනත**

(188 වෙනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් කරනු ලබන දැන්වීමයි.

ඇස්. ඇස්. කුලතිලක,
සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1973. 07. 31 දින,
කොළඹ දීය.

දැන්වීම

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ ගාලු මහා නගර සීමාවතුළ පිහිටි අංක ඒ 1484 දරණ මූලික පිඹුරේ 1 වෙනි බිම් කැබැල්ලට අසු වන ඉඩම තුල ඇති පැරණි ඕලන්ද සොහොන් බිම (188 වෙනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ කාර්යයන් සඳහා ආරක්ෂිත ස්මාරකයක් විය යුතු බව ප්‍රකාශ කරමින් එකී ආඥාපනතේ 18 වෙනි වගන්තිය යටතේ ආඥාවක් පැනවීමට අදහස් කරනු ලැබේ.

යථෝක්ත ආඥාව පැනවීම ගැන විරුද්ධතා 1973. 09. 29 වෙනිදා හෝ ඊට කලින් කොළඹ, පුරාවිද්‍යා කොමසාරිස් වෙත ලැබෙන ලෙස එවිය යුතුය. එවැනි සෑම විරුද්ධතාවයක්ම ලියවිල්ලකින් වියයුතු අතර, එවැනි විරුද්ධතාවයන් ඉදිරිපත් කරනු ලබන්නේ කවර හේතුන් උඩද යන වග දැක්වෙන ප්‍රකාශයක් ඊට ඇතුළත්විය යුතුය.

8-976—73.08.24 දින අංක 74 දරන ගැසට් පත්‍රය

**1954 අංක 37 දරණ ජාතික නිවාස පනත**

**49 ඡේදය යටතේ සහතිකය**

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගතයුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1973 අගෝස්තු 07 දින,
කොළඹදීය.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හිරිපිටිය ග්‍රාමසේවක කොට්ඨාශයේ බාදුරාගොඩ පාරේ පිහිටි හිරිපිටිය වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අ. 2½ ක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස ;

නැගෙනහිරට : වේයන්ගොඩ බාදුරාගොඩ පාර ;

දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;

බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස සහ කුඹුර.

8-948—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

සාපාශා 6/අත්/දෙඉ/2
1973. 08. 08 දින,
කොළඹ දීය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරළේ ඉඹුල්ගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ 328 පත්තල ගෙදර ග්‍රාමසේවක කොට්ඨාශයේ වේයන්ගොඩ—අත්තනගල්ල පාරේ පිහිටි බෝලවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 4ක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : මෙම ඉඩමේම කොටසක් (වත්තේ බංගලාවට යන පාර) ;

නැගෙනහිරට : වේයන්ගොඩ-අත්තනගල්ල පාර ;

දකුණට : කපිතාන් ඩෙප් ගේ ඉඩම ;

බස්නාහිරට : මෙම ඉඩමේම කොටසක්.

8-949—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

### උප්පැන්න හා මරණ ලියාපදිංචිකිරීමේ පනත

### 5 වන වගන්තිය යටතේ නිවේදනය

(110 වන අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියාපදිංචිකිරීමේ පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1935 සැප්තැම්බර් 20 වන දින අංක 8,146 දරණ ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළ කරනු ලැබ කලින් කල සංශෝධනය කරනු ලැබූ නිවේදනය, එහි වූ උපලේඛනයෙහි "ඌව පළාත—බදුල්ල දිස්ත්‍රික්කය" යන ශීර්ෂය යටතේ :—

1. රිල්පොල කොට්ඨාශයට අදාල වන අංක 2 දරන විෂය වෙනුවට මෙහි "අ" උපලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් හා,

2. අංක 2 දරන විෂයට ඉක්බිතිවම මෙහි "ආ" උපලේඛනයේ සඳහන් 2 "අ" දරන අළුත් විෂය ඇතුලත් කිරීමෙන්,

1973 සැප්තැම්බර් මස 01 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ෆිලික්ස්. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍ය.

1973 අගෝස්තු මස 01 වෙනි දින,
කොළඹ දීය.

### "අ" උපලේඛනය

2. පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත රිල්පොල කොට්ඨාශය :—

| | |
|---|---|
| අලුබෝගොල්ල | කන්දෙඅරාව |
| බැද්දේගම හෙලගම | කනුපැලැල්ල |
| බැද්දේගම මැදගම | කෝට්ටෙගොඩ පල්ලේගම |
| බැද්දේගම පහලගම | කෝට්ටෙගොඩ උඩගම |
| බැද්දේ කුඹුර | මහවත්තේ ගම |
| බුලත්වත්ත | මැදගම |
| ගල්කැටිය | පරගහඇල්ල |
| ගොඩේගම | පහල කඳන |
| හපුකැලේගම | උනගොල්ලේගම |
| ඉහළකඳන | වැළිවත්තේගම |
| ඉඹුල්ගොඩ | වේවැල්හින්න |
| කන්දෙඅරාව | වැලිකේමුල්ල |

### "ආ" උපලේඛනය

2 අ. පහත සඳහන් ග්‍රාමයන්ගෙන් සමන්විත රඹුක්පොත කොට්ඨාශය :—

| | |
|---|---|
| අන්දෙනිය | හීන්නාරන්ගොල්ල |
| අලිගබැද්ද | ඉලුක්තැන්න |
| අලුබෝගොල්ල (හිගුරුගමුව වසම) | කන්දේකුඹුර |
| අලුබෝගොල්ල (කැන්දගොල්ල වසම) | කැන්ද ගොල්ල |
| ඇල්ලිඅරාව | මලන්ගමුව |
| දමන්වර | මැටිගහතැන්න |
| දෙබැද්ද | මොටමාලේ |
| ගල්පොත්තාවෙල | නෙළුන්වැව පතන |
| ගොමගොඩ | පුස්වැල් ගොල්ල |
| හම්බාවෙල | රඹුක්පොත |
| හපුගහකුඹුර | උඩවෙල |
| හැගොඩ | වැකඩ |
| | වැදිගුනේ. |

8-1038—73.08.24 දින අංක 74 දරන ගැසට් පත්‍රය

### 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වැවිලි කර්මාන්ත ඇමති කොල්වින් රෙජිනෝල්ඩ් ද සිල්වා වන මම ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සාමාජිකයෙකු වශයෙන් චූලප්‍රේම මර්වින් ද වාස් මහතා, 1973 මැයි මස 25 වෙනි දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරමි.

කොල්වින් ආර්. ද සිල්වා,
වැවිලි කර්මාන්ත ඇමති.

1973 අගෝස්තු මස 06 දින,
කොළඹ 1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ,
අංක 6 දරණ ස්ථානයේ පිහිටි වැවිලි කර්මාන්ත
අමාත්‍යාංශයේ දීය.

8-901—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

පහත සඳහන් පත්වීම කිරීමට විදේශීය හා දේශීය වෙළඳ ඇමතිතුමා සතුටුවී ඇත :—

සහකාර වානිජ අධ්‍යක්ෂ ඒ. එස්. නඩරාජා මහතා 1973 ජූලි මස 17 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂවරයෙකු ලෙස වැඩ බැලීමට.

ආචාර්ය ජේ. බී. කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 අගෝස්තු මස 14 දින,
කොළඹ දී ය.

8-970—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

### මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1973 ජූනි මස 29 වැනි දින අංක 65/14 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අංක 533 දරණ ආහාර මිල නියෝගය (කිරි ආහාර—සම්පූර්ණ යොදය සහිත කිරිපිටි (ලක්ස්ප්‍රේ) සහ උකු කළ කිරි වර්ග) විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් 1973.08.14 දින අනුමත කරනු ලැබූ බව, (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4(7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ.

8-1062/1—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

### මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1973 ජූනි මස 13 වැනි දින අංක 67/8 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අංක සී. 533 දරණ ආහාර මිල නියෝගය (අතිරේක ආහාර ද්‍රව්‍ය—කොත්තමල්ලි) විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් 1973.08.14 දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ.

8-1062/2—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

### ආඥා අංක 17

1970 අංක 14 දරණ මහවැලි සංවර්ධන මණ්ඩල පනතේ 27 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වාරිමාර්ග විදුලි බලය හා මහා මාර්ග ඇමති, මෛත්‍රීපාල සේනානායක වන මම, මහවැලි සංවර්ධන මණ්ඩලයට අවශ්‍යවී ඇත්තාවූද, පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තා වූද ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග විදුලිබලය හා මහාමාර්ග ඇමති.

යොමු අංකය : වා.වි.ම/ලේ—ඩබ්/එම්ඩී/එල්ඒ/6/73
යොමු අංකය : ම.ස.ම—ආර්ඇන්ජී/බීඕඩබ්/13

1973 අගෝස්තු මස 8 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

ශ්‍රී ලංකා ජනරජයේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිළිහුඩුගොල්ල ග්‍රාමසේවක වසමට අයිති පිළිහුඩුගොල්ල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 5, රූඩ් 3, පර්චස් 0 ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම් :—

**අවසාන ගම් පිඹුරු අංක 252 ; ලොට් අංක 225**

උතුරට : ලොට් අංක 222 සහ ලොට් අංක 226 ;
දකුණට : මල ඇල ;
නැගෙනහිරට : ලොට් අංක 226 ;
බස්නාහිරට : ලොට් අංක 222, 223 සහ 224.

හිමිකම් කියන අය : පී. ඇම්. කරුණාසිංහ සහ වෙනත් අය, ඩබ්ලිව්. මුදියන්සේ සහ වෙනත් අය, ඩබ්ලිව්. පුංචිරාල සහ සී. ඇම්. සීලවතී ; ප්‍රමාණය : අ. 5, රූ. 3, පර්. 0.

8-9[illegible]—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය
977

### බන්ධනාගාර ආඥාපනත

35(1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥාපනතෙහි 35 (1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්, 1973 අගෝස්තු 1 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා, ඩී. එල්. එච්. ඩිබට් සිල්වා මහතා. එස්. ඒ. රොබට් මහතා, සී. එස්. පෙරේරා මහතා සහ ඕ. පී. පියසේන මහතා මෙයින් පත් කරමි.

ෆීලික්ස්. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 අගෝස්තු 10 දින,
කොළඹ දී ය.

8-972/1—73.08.24 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

### බන්ධනාගාර ආඥාපනත

35 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥාපනතෙහි 35 (1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, මහර බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන්, 1973 අගෝස්තු 1 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා, ඩී. ඊ. කස්තුරිආරච්චි මහතා, එන්. ලියෝනාරේ මහතා, ඩබ්ලිව්. ඒ. අමරසේන මහතා සහ ඩබ්ලිව්. ඒ. ඩී. ඒබ්‍රහම් මහතා මෙයින් පත් කරමි.

ෆීලික්ස්. ආර්. ඩී. බණ්ඩාරනායක.
අධිකරණ ඇමති.

1973 අගෝස්තු 10 දින,
කොළඹ දී ය.

8-972/2—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

### බන්ධනාගාර ආඥාපනත

35 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වන අධිකාරය වන) බන්ධනාගාර ආඥාපනතෙහි 35 (1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, ගාල්ල බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්, 1973 අගෝස්තු 1 වන දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා පී. පී. ලියනගේ මහතා, ඒ. ඩබ්ලිව්. ආදිහෙට්ටි මහතා, ජෙරල්ඩ් නානායක්කාර මහතා සහ හෙක්ටර් වීරසේකර මහතා මෙයින් පත් කරමි.

ෆීලික්ස්. ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 අගෝස්තු 10 දින,
කොළඹ දී ය.

8-972/3—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

ඇල්. ඩී.—බී. 207/41.

**පඩිපාලක සභා ආඥාපනත**

8 වැනි වගන්තිය යටතේ ආඥාව

කම්කරු ඇමති, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන, වන මම, (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ ඇඹ හා වඩු කර්මාන්තයට අදාළව පනවනු ලැබ 1973 ජූලි මස 01 වැනි දින හා අංක 62 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලද ආඥාවෙහි වඩා සවිස්තරව දක්වා ඇති ඒ කර්මාන්තය සඳහා පඩිපාලක සභාවක් මේ ආඥාවෙන් පිහිටුවමි.

ඇම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ දීය.

8-924/1—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

පඩිපාලක සභා ආඥාපනතේ (136 වන අධිකාරය) 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ඇඹ හා වඩු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ ලේකම්වරයා වශයෙන් කම්කරු නිලධාරි එදිරිසිංහගේ දොන් වුලපොල විමලරත්න මහතා නැවත නියෝග කරනතුරු කම්කරු ඇමතිතුමන් විසින් පත් කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ දීය.

8-924/2—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් කුඹුක දැරණියගල වලව්වේ පදිංචි සමරසුන්දර ආරච්චිගේ පීටර් සමරසුන්දර මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ අගෝස්තු මස 04 දින,
කොළඹ දිය.

8-911—73.08.24 දින අංක 74 දරණ ගැසට පත්‍රය

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකු වූ ඒ. ඇල්. පෙරේරා මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් ඊ. ඇම්. විජේනායක මහතා පත් කරන ලද බව වශී 1971 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-1015—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

1973 අප්‍රේල් මස 01 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1971 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

**නම නියමකොට පත් කරන සාමාජිකවරු**

නාරද ජයකොඩි මහතා
වෛද්‍යාචාර්‍ය ඇම්. සී. චන්ද්‍රසේන මහතා
සාමවිනිසුරු ආර්. ඇම්. ඇස්. රත්නායක මහතා

**සේව්‍ය නියෝජිත සාමාජිකවරු**

ටී. ආර්. ආර්. විජේවික්‍රම මහතා
සී. රාජසූරිය මහතා
සී. ඇම්. ඒ. ස්ප්ලෙන්ඩේවින් ඩ් මහතා
තෝමස් අමරසූරිය මහතා
සී. ඊ. හෙට්ටිආරච්චි මහතා
ආර්. සල්ගාදු මහතා
සාමවිනිසුරු කේ. වී. ඇම්. සුබ්‍රමනියම් මහතා
ඩබ්. ඇස්. ද සිල්වා මහතා

**සේවක නියෝජිත සාමාජිකවරු**

ඩබ්. කේ. සෙනෙවිරත්න මහතා
කේ. ආර්. මාරිමුත්තු මහතා
ඇස්. සෙල්ලයියා මහතා
ඇස්. ලෙස්ලි ප්‍රනාන්දු මහතා
එච්. ඇම්. විජේවර්ධන මහතා
ආනන්ද දසනායක මහතා
මහජන මන්ත්‍රී ඇම්. ඊ. මැන්දිස් මහතා
ඩබ්. ජී. රත්නායක මහතා

8-1015—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනය

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරනු ලැබ, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණයන් කම්කරු ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව ඒ ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මේ තීරණ 1973 අගෝස්තු මස 20 වැනි දින සිට වලංගු විය යුතුය.**

ඇ. එ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 09 දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව 1946 මැයි මස 24 වැනි දින අංක 9,560 දරන ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයේ උපලේඛනයෙහි දක්වා ඇත්තාවූ ද කලින් කල වෙනස් කරන ලද්දාවූ ද තීරණ, එම උපලේඛනයෙහි V වැනි කොටසේ "ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)" යන ශීර්ෂය යටතේ ඇති 9 වන ඡේදයේ (අ) අනුච්ඡේදය වෙනුවට පහත දැක්වෙන අළුත් අනුච්ඡේදය ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය :—

"ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)"

(අ) මේ ඡේදයෙහි හා 10 වන ඡේදයෙහි විධිවිධාන වලට යටත්ව සෑම සේවා යෝජකයකුම විසින් තමා යටතේ සේවයෙහි යොදවා ඇති සියළුම කම්කරුවන්ට, 1971 අංක 29 දරණ

නිවාඩු පනතේ අර්ථානුකූලව පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් පඩි සහිත නිවාඩු දින වශයෙන් දිය යුතුය:—

(1) දෙමළ තෛපොන්ගල් දිනය;

(2) සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනය;

(3) මීලා-දුන්-නබි (මොහමඩ් නබිනායක තුමාණන් වහන්සේගේ උපන් දිනය);

(4) මැයි දිනය (මැයි 1);

(5) ජනරජ දිනය (මැයි 22);

(6) සිංහල වෙසක් මාසයේ පුර පසළොස්වක් පොහෝ දිනය;

(7) බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය (සැප්තැම්බර් 26); සහ

(8) නත්තල් දිනය.

8-1032—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

1973 අප්‍රේල් මස 01 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ පොල් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1971 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. ඒ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

**නම් නියම කොට පත්කරන සාමාජිකවරු**

මහාචාර්ය ඒ. ඩී. වී. ද ඇස්. ඉන්ද්‍රරත්න මහතා
ඇල්. ආර්. පෙරේරා මහතා
ලේප්ටිනන්ට් කර්නල් ඊ. ඒ. පේරුසිංහ ඊ.ඩී. මහතා

**සේව්‍ය නියෝජිතයින්**

ඊ. ඇස්. අප්පදොරේ මහතා
ජේ. ඩබ්ලිව්. බී. පෙරේරා මහතා
ඒ. රාසනායගම් මහතා
ටී. ඩී. ඇෆ්. ඇල්. පීරිස් මහතා
කේ. ඇස්. ගුණසේකර මහතා
කේ. සෙල්වනාදන් මහතා
ආර්. අයි. ප්‍රනාන්දු පුල්ලේ මහතා
ඇල්. ඊ. ගුණසේකර මහතා

**සේවක නියෝජිතයින්**

මහින්ද අමරසේකර මහතා
ඩබ්ලිව්. එච්. ඇම්. ඩිංගිරිබණ්ඩා මහතා
පූජිත ගුණවර්ධන මහතා
ආනන්ද දසනායක මහතා
කේ. ඩී. මැන්දිස් මහතා
කේ. ඇස්. ඇල්. ප්‍රනාන්දු මහතා
ඒ. ජයසූරිය මහතා
ඇල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා

8-1033—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**පඩි පාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

(136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 30 වන වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මීට යාව ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් සවකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට (වොකලට් සෑදීම ඇතුළුව), බිස්කෝතු සෑදීමේ හා රසකැවිලි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වෙනි වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා වගී 1973 සැප්තැම්බර් මස 10 වන දින දවල් 12 දක්වා එම පඩි පාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරුද්ධතාවයක් ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් විය යුතුය.

ඩබ්. එල්. පී. ද මැල්,
(චොකලට් සෑදීම ඇතුළුව)
බිස්කෝතු සෑදීමේ හා රසකැවිලි සෑදීමේ
කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සභාපති.

1973. 08. 16 වැනි දින,
කොළඹදීය.

**උපලේඛනය**

(චොකලට් සෑදීම ඇතුළුව) බිස්කෝතු සෑදීමේ හා රසකැවිලි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව වගී 1968 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා කලින් කල වෙනස් කරන ලද්ද වූ තීරණ එම උපලේඛනයෙහි IV වන කොටසෙහි "ආණ්ඩුවේ නිවාඩු දවස්" (25 වෙනි වගන්තිය) යන ශීර්ෂය යටතේ ඇති (7) වෙනි ඡේදය වෙනුවට පහත දැක්වෙන අළුත් ඡේදය ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය:—

(1) දෙමළ තෛපොන්ගල් දිනය;
(2) සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනට පෙරාතුවම වූ දිනය;
(3) සිංහල හා දෙමල අළුත් අවුරුදු දිනය;
(4) මැයි දිනය (මැයි 1);
(5) සිංහල වෙසක් මාසයේ පුන් පොහෝ දිනයට ඉක්බිතිවම එළඹෙන දිනය;
(6) ජනරජ දිනය (මැයි 22);
(7) මීලා-දුන්-නබි (මොහොමඩ් නබි නායකතුමාණන් වහන්සේ උපන් දිනය);
(8) බණ්ඩාරනායක අනුස්මරණ දිනය (සැප්තැම්බර් 26);
(9) නත්තල් දිනය.

එසේ ද වුව පහත සඳහන් නියමයන්ට යටත්ව කවර කම්කරුවකු වුවද එබඳු කවර ආණ්ඩුවේ නිවාඩු දිනයක වුවත් සේවා යෝජකයා විසින් වැඩෙහි යොදවා ගැනිය හැකිය:—

(අ) එම කම්කරුවා එබඳු ආණ්ඩුවේ නිවාඩු දිනයකදී එදිනට අදාල වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණනට වැඩියෙන් වැඩෙහි යොදවා නොගත යුතුය;

(ආ) එම කම්කරුවාට එබඳු ආණ්ඩුවේ නිවාඩු දිනයට පෙර දිනය නිවාඩු දවසක් වශයෙන් දිය යුතුය. නැතහොත් මාසික ක්‍රමයට ගෙවන වේතනයට අමතරව අඩුම මාසික වැටුප් ප්‍රමාණයෙන් 1/25 කට නො අඩු ගෙවීමක් කළ යුතුය; සිහ

(ඇ) එම කම්කරුවා එබඳු ආණ්ඩුවේ නිවාඩු දිනයට පෙර දිනයෙහි වැඩෙහි යොදවා ගන්නේ නම් ඒ දිනයෙහිදී එදිනට අදාල වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණනට වැඩියෙන් ඔහු වැඩෙහි යොදවා නොගත යුතුය.

8-1102—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

අංක: ටි. 7/1094.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**
**4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය ශ්‍රී ලංකා කම්කරු සමිතිය, සිදුව සහ ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය, සීදුව, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත, සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 3, අල්විස් ටෙරස්, අංක 12 හි පදිංචි එල්. ඊ. ජේ. ප්‍රනාන්දු මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 අගෝස්තු මස 10 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලීය—
ශ්‍රී ලංකා කම්කරු සමිතිය, සීදූව.

සහ

ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය,
සීදූව

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්, සීදූව ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලීය ශ්‍රී ලංකා කම්කරු සමිතියේ පහත සඳහන් සාමාජිකයින්ට කාර්මික හා කාර්මික සුපරික්සුම් ශ්‍රේණිවල වැටුප් පරිමාණයන් හා හිඟ වැටුප් ඔවුන්ගේ පත්වීම් දින සිට බලපාතසේ ගෙවන ලෙස සමිතිය කරන ඉල්ලීම යුක්තිසහගතද යන්නත්, ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳ වේ:—

1. බී. එස්. ඩීන් ... ගබඩාකරු
2. ඒ. ඩී. ජිනපාල ... ගබඩාකරු
3. ජී. ජේ. පෙරේරා ... ගබඩාකරු
4. ටී. ආර්. ප්‍රනාන්දු ... සහකාර ගබඩාකරු
5. එම්. කෝසවරාජා ... සහකාර ගබඩාකරු
6. එච්. ගොඩිගමුව ... සහකාර ගබඩාකරු
7. ඩී. ඊ. එෆ්. වික්‍රමතුංග ... සහකාර ගබඩාකරු
8. ජී. ඒ. සී. එස්. පීරිස් ... සහකාර ගබඩාකරු
9. එන්. ඩබ්. පී. පී. බී එන් පෙරේරා සහකාර ආරක්ෂක නිලධාරි

1973 අගෝස්තු මස 03 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

8-1010 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

අංක සී/අයි.278

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

**4(1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව කොළඹ 2, අංක 9, ද මැල් වීදියේ ලංකා සිනමා සහ චිත්‍රාගාර සේවක සමිතිය එක් පාර්ශවයක් වශයෙන්ද, කොළඹ 8, බොරැල්ල, කොටාරෝඩ්, රිච්ස් තියටර්හි අයිතිකරුවන් වන, ජේ. එන්. රාමසාමි සහ සහෝදරයන්හි කොටස්කරුවන් වූ හස්සරාම් සොබ්රාජ්මාල් සුර්තානි, මොහන්දස් සොබ්රාජ්මාල් සුර්තානි, ජාසික්‍රිෂ්නදස් සොබ්රාජ්මාල් සුර්තානි, රාම් මොහන්දාස් සුර්තානි යන මහතුන් අනෙක් පාර්ශ්වය වශයන්, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

